<u>සිංහල පරිවර්තනය</u>

## නිවේදන අංක: MoH-NP/2026/01

### උතුරු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2026

උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NP/07/10/01/226 අංක දරණ 2026.03.26 දිනැති සහ උතුරු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) ගේ අංක NP/17/Cad/01/62 දරණ 2026.03.30 දිනැති ලිපි මගින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 300 ක් සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය, උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් **2026 මැයි මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.05.05** වේ.

### 01. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

**2013.01.01** වැනි දින සිට බලපැවැත්වෙන උතුරු පළාත් වන සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියේ තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගන්නා අයදුම්කරුවන් **සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

01.1. පත්වීමක් සඳහා තෝරාගන්නා අපේක්ෂකයන් පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි **සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියට** බඳවා ගත් දින සිට **වසර 03 ක්** ඇතුළත **පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන්** සමත් විය යුතුය.

01.2. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතු අතර, එසේ සේවය කිරීමට හැකි ශාරීරික යෝග්‍යතාවකින් යුතු බවට, නියම කරන ආකාරයට සනාථ කළ යුතුය.

01.3. එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් **වසර 05 ක්** අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි.

01.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

01.5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ සම්පූර්ණ එකතුව **තුන්සියය (300) කි.** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## **02.** වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **PL 1-2025** වැටුප් කේතය අනුව **සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියේ** තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.40,000 - 10 X 450 - 10 X 490 - 10 X 540 - 12 X 590 - 61,880/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ තුන්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## **03.** සාමාන්‍ය සුදුසුකම්

03.1. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය. අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය**.**

**(*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)**

03.2. සෑම අයදුම්කරුවෙකුම උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුතු විය යුතු අතර, යහපත් චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.

03.3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 45** ට නොවැඩි විය යුතුය.

03.4. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

## **04.** අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

**(අ)** <u>අධ්‍යාපන සුදුසුකම්</u>

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගණනක දී** විෂයයන් **දෙකකට (02)** සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය. කෙසේ වෙතත් **එක් වරකදී අවම වශයෙන් විෂයයන් පහකින් (05)** සමත්ව තිබිය යුතුය.

## **05.** බඳවා ගැනීමේ පරිපාටිය

05.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, සේවා ව්‍යවස්ථා සංග්‍රහය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව බඳවා ගනු ලැබේ.

05.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව (Merit Order) අනුව පත්වීම සඳහා තෝරා ගනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

## **06.** වෘහුගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු

අයදුම්කරු, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් **"ලේකම්, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය, උතුරු පළාත"** යන නමට ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## **07.** අයදුම්කිරීමේ පිළිවෙල

07.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය, උතුරු පළාත, සෞඛ්‍ය ගම්මානය, පන්නෙයි, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

07.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සෞඛ්‍ය සේවා සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණියට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

07.3. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් එවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර කැඳවීම් ලිපි නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය, උතුරු පළාත, සෞඛ්‍ය ගම්මානය, පන්නෙයි, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2220807** / ෆැක්ස් අංකය - **021-2220806** / විද්‍යුත් තැපෑල - **mhealthnpc@gmail.com**)

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ"** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් **උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්** විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසි උල්ලංඝණය කළහොත් **උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්** විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

## 09. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රු.854,880.00 ට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 10. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

මෙය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් වේ. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පහත දැක්වෙන කොටස් වලින් සමන්විත වේ. මෙය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අනු අංකය | විෂයය | ලකුණු |
|---|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 40 |
| 02 | පළපුරුද්ද | ලකුණු 55 |
| 03 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගත් සුදුසුකම් | ලකුණු 05 |
| | **මුළු ලකුණු** | **ලකුණු 100** |

- **සවිස්තරාත්මක ලකුණු ලබාදීමේ පිළිවෙල "ඇමුණුම I" හි දක්වා ඇත.**

## 11. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල

අපේක්ෂකයින් සඳහා සම්පූර්ණ කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලැබේ.

**<u>සැළකිය යුතුය</u>**

(i). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම් සතුය.

(iii). මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ දූරකතන අංක 021-2220807 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**පී.ජෙයරාණි**
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය
උතුරු පළාත
**2026.04.09**